# රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය

# ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

# මිල ගණන් කැඳවීමයි

ප්‍රසම්පාදන අංකය - DMC/FIN/2021 (PROCU: 15)

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා යොදාගනු ලබන ජංගම ප්‍රදර්ශන කට්ටල සඳහා අවශ්‍ය පහත දැක්වෙන අයිතමයන් මිලදී ගැනීම වෙනුවෙන් වන ප්‍රසම්පාදනය සඳහා උනන්දුවක් දක්වන පාර්ශවයන් වෙතින් මිල ගණන් කැඳවීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කර තිබේ.

| අයිතමය | මිලදී ගැනීමට නියමිත ප්‍රමාණයන් |
|---|---|
| පහසුවෙන් හැසිරවිය හැකි/ප්‍රධාන නාම පුවරු (Portable Backdrop Display Stand) | 07 |
| ඉහල පහල නැමිය හැකි නාම පුවරු (Pull up Banners) | 21 |
| අලංකාර කරන ලද ප්‍රදර්ශන කවුළු (Exhibition Stall Counter) | 07 |
| අත් ප්‍රතිකා රඳවන (Leaflet Brochure Stand) | 18 |
| කාපට් (Carpet) | 16 |
| හැකිලිය හැකි පුටු (Fordable Chair) | 14 |
| සුනාමි කුළුණේ ආකෘති (Tsunami Tower Model) | 07 |
| ප්‍රදර්ශන සඳහා විදුලි පංකා (High-end Fan) | 07 |

ඒ අනුව, උක්ත ප්‍රසම්පාදනය සම්බන්ධව ඔබ ආයතනය උනන්දුවක් දක්වන්නේ නම්, මේ සමඟ පහතින් දක්වා ඇති පිරිවිතරයන්ට අනුව වන ඔබ ආයතනයේ මුද්‍රා තැබූ මිල ගණන්, 2021.06.14 දින පෙ.ව.10.30 හෝ ඊට පෙර “ප්‍රදර්ශන කට්ටල මිලදී ගැනීම - DMC” යනුවෙන් ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කර අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ප්‍රසම්පාදන ඒකකය, මුදල් අංශය, 3 වන මහළ, විද්‍යා මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑල මගින් හෝ 3 වන මහලේ, මුදල් අංශයේ ඇති ටෙන්ඩර් පෙට්ටිය වෙත ගෙනැවිත් බහාලන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

තවද, මිල ගණන් ඉදිරිපත් කිරීමේදී, ඔබ ආයතනයේ බලයලත් නිලධාරියෙකු විසින් අත්සන් කර හා ආයතනයේ නිල මුද්‍රාව තබා මිල ගණන් ඉදිරිපත් කිරීම අනිවාර්යය